# 25 පුණ්‍ය භූමි

ස්වකීය ජන්ම භූමියෙහි පවත්නා සුන්දරත්වය, ප්‍රෞඪත්වය හා අදීනත්වය ගැන ලියැවුණු ගීතවලට සවන් යොමු කිරීමේ දී අපේ සිත් සතන් ප්‍රීතියෙන් මෙන් ම දේශාභිමානී හැඟීම්වලින් ද උද්දාමයට පත්වේ. එබඳු දේශාභිමානී හැඟීම් දනවන ගීත දෙකක් මේ පාඩමේ ඇතුළත් කර ඇත. මේ අතරින් 'ස්වර්ණ භූමි' ගීතයෙහි රචකයා රත්න ශ්‍රී විජේසිංහ මහතා ය. උදාන ගීතයේ රචකයා සුනිල් සරත් පෙරේරා මහතා ය.

## ස්වර්ණ භූමි

මහියංගණේ රන්කොත උඩින්
පාළොස්වකේ සඳ පායනා
දෙදහස් වසක් මවු තුරුලේ වූ
මේ පුණ්‍ය භූමි වාසනා

මහ බෝධියේ ඉඳුනිල් පතින්
නැඟි සෙත් පිරිත් ස්වර ගායනා
සීගිරි ගලේ සෝපානයේ
අප්සරා රූ නෙතු අංජනා
මේ රම්‍ය භූමි වාසනා

සිකිපිල් සලන ගන නිල් වනේ
සැළලිහිණි කෝකිල ගායනා
මුතු බැඳි ගෙලේ මණිමේඛලා
වෙරළත නිලන සළු සෝබනා
මේ ස්වර්ණ භූමි වාසනා

# උදාන ගීතය

උපතින් ලද සැනසුම්
සැපතින් පිරි මනරම්
ලක් දෙරණත ලක් දන වෙත
පත් මේ සුව නිවහල්

රන් කරලින් මන් පොබයන
රන් කෙත සිරි රඳනා
පින් මහිමෙහි රන් යුගයෙක
රන් අරුණලු රඟනා

මංගල බරණින් සැරැහී
රන් ජය මිණි ලෙළවා
මංගල ගමනක් අරඹයි
තුන් හෙළය ම නළවා

## ක්‍රියාකාරකම 01

i. පන්තිය කණ්ඩායම් දෙකකට බෙදී මේ ගීත සාමූහික ව ගායනා කරන්න. (හැකිනම් සංගීත ගුරුවරයාගේ සහාය ලබා ගැනීම වැදගත් ය.)

ii. මවුබිමේ වාසනාව ධ්වනිත කිරීම සඳහා 'ස්වර්ණ භූමි' ගීත රචකයා යොදාගත් උපක්‍රම මොනවා ද?

iii. පළමු වන ගීතයේ දී "අපේ ජාතික උරුමය පිළිබඳ ව මහත් අභිමානයෙන් යුතු ව තොරතුරු ඉදිරිපත් කෙරේ." මේ බව සනාථ කිරීම සඳහා ගීත රචකයා යොදාගත් කරුණු තුනක් දක්වන්න.

iv. උදාන ගීතයේ රචකයා හැඟීම් දනවීම සඳහා ශබ්ද ධ්වනිය යොදාගෙන ඇති අවස්ථා නිදසුන් මඟින් පැහැදිලි කරන්න.

v. 'රන් යුගයෙක රන් අරුණලු රඳනා' යන ගී කොටසින් ධ්වනිත වන 'රන් යුගය' යන්නට තුඩුදුන් හේතු සාධකය කුමක් ද?

## ක්‍රියාකාරකම 02

i. පළමු වන ගීතයේ දැක්වෙන මේ යෙදුම්වල අරුත් පැහැදිලි කරන්න.

* 'මහ බෝධියේ ඉඳුනිල් පතින්
නැගි සෙත් පිරිත් ස්වර ගායනා'

* 'සීගිරි ගලේ සෝපානයේ
අප්සරා රූ නෙතු අංජනා'

* 'මුතු බැඳි ගෙලේ මණිමේඛලා
වෙරළත නිලන සළු සෝබනා'

ii. පළමු වන ගීතයේ රචකයා යොදා ඇති 'පුණ්‍ය භූමි' 'රම්‍ය භූමි' හා 'ස්වර්ණ භූමි' යන යෙදුම් කෙතෙක් දුරට අවස්ථාවට උචිත වේ දැයි විමසන්න.

iii. දෙ වන ගීතයේ දැක්වෙන පරිදි මංගල ගමනක් ඇරඹීම සඳහා ලක් දෙරණත සැරසෙන ආකාරය පැහැදිලි කරන්න.

iv. මේ ගීත දෙකින් ඔබ කැමති නිර්මාණයක් ගැන ඇගයීමක් කරන්න.

## ක්‍රියාකාරකම 03

i. මේ ගීත දෙකෙහි ඇතුළත් සමාස පද උපුටා දක්වා නම් කරන්න.
උදා: - රන් කොත, විභක්ති සමාසය

ii. දෙ වන ගීතයෙහි ඇතුළත් පූර්වක්‍රියා පද තුනක් උපුටා දක්වන්න.

iii. දෙවන ගීතයේ දැක්වෙන මනරම්, දෙරණත, නිවහල්, පොබයන, බරණින් යන පදවල පර්යාය පද දක්වන්න. ඔබ තෝරාගත් පර්යාය පද යොදා එක් එක් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

### පැවරුම

01. අප රටට වාසනාව ගෙන දෙන අවස්ථා තුනක් පළමු වන ගීතයෙහි දැක්වේ. මෙයින් එක් අවස්ථාවක් තෝරා ගෙන එය චිත්‍රයට නගන්න.

02. දේශාභිමානී ගීත එකතු කර ඔබ පාසල් පුස්තකාලයේ පරිහරණය සඳහා කුඩා පොතක් පිළියෙල කරන්න.

03. වෙනත් දේශාභිමානි ගීත දෙකක් තෝරා ගෙන පන්තිය කණ්ඩායම් දෙකකට බෙදී ගායනා කරන්න. ඔබ තෝරාගත් ගී පිළිබඳ ඇගයීමක් කරන්න.

04. මෙවැනි කුඩා ගීතයක් නිර්මාණය කරන්න.

## විෂය නිර්දේශය

## 11 වන ශ්‍රේණිය

### 1.0 නිපුණතාව

සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

1.1 විද්‍යුත් මාධ්‍ය වැඩ සටහන්වලට සවන්දීමේ පුරුදු ප්‍රායෝගික භාෂා කාර්යයන් ඉටු කර ගැනීම සඳහා යොදා ගනියි.

1.2 දේශන සාකච්ඡා ආදියට සවන්දීමේ පුරුද්ද මඟින් විචාරාක්ෂියෙන් යුතු ව භාෂාව හැසිරවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.

1.3 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසාස්වාදයේ යෙදෙයි.

### 2.0 නිපුණතාව

තම අදහස් අර්ථවත් ව තර්කානුකූල ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතා ප්‍රදර්ශනය කරයි.

2.1 කරුණු සංවිධානය කරගනිමින් නිරවුල් ව හා නිවැරදි ව කතා කරයි.

2.2 තර්කානුකූල ව හා විචාරශීලී ව කතා කරයි.

2.3 නිවැරදි ව බස හසුරුවමින් ආකර්ෂණීය ලෙස නිවේදනයේ හා විස්තර ප්‍රචාරයේ යෙදෙයි.

### 3.0 නිපුණතාව

ජීවන අත්දැකීම් පුළුල් කරගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

3.1 අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවයි.

3.2 නූතන පද්‍ය නිර්මාණ

### 4.0 නිපුණතාව

අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

4.1 අදහස් නිරවුල් ව නිවැරදි ව ඉදිරිපත් කරමින් උචිත කරුණු සංවිධානය කරමින් ලියයි.

## 5.0 නිපුණතාව

භාෂා ක්‍රියාකාරකම් මඟින් වාග්මාලාව පෝෂණය කරගෙන භාෂාමය කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනියි.

5.1 සාම්ප්‍රදායික යෙදුම් භාෂා කාර්යයන් සඳහා අර්ථවත් ලෙස යොදා ගනියි.

5.2 විවිධ භාෂා ව්‍යවහාර හඳුනාගනිමින් සන්නිවේදනය පහසු කර ගනියි.

## 6.0 නිපුණතාව

ජීවිත අවශ්‍යතා සාක්ෂාත්කරණය සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

6.1 ප්‍රායෝගික භාෂා කාර්යයන් පහසු කර ගැනීම සඳහා ලිපි ලේඛන සාරාංශ කර ලියයි.

6.2 ආකෘති පත්‍ර පිරවීමේ හා ආකෘති පත්‍ර සකස් කිරීමේ පරිචය ලබයි.

6.3 රසවත් ව තොරතුරු ප්‍රකාශ කිරීම සඳහා පුවත්පත් වාර්තා සකස් කරයි.

## 7.0 නිපුණතාව

සිංහල අක්ෂරමාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් ලියයි.

7.1 ප්‍රායෝගික භාෂා කාර්යය මැනවින් ඉටුකර ගැනීම සඳහා සිංහල අකාරාදියේ භාවිතය යොදා ගනියි.

## 8.0 නිපුණතාව

වියරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයන් ඉටු කරගනියි.

8.1 පද සාධනය පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

- සමාස
  - සමාසය පිළිබඳ හැඳින්වීම (වර්තමාන ව්‍යවහාරානුසාරයෙන්)
  - සමාස වර්ග
  - භාෂා ව්‍යවහාරයේ දී සමාස භාවිත කිරීම

8.2 සම්මත රීතිවලට අනුකූල ව වාක්‍ය ලියයි.

- උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ විශේෂ වාක්‍ය රීති

## 9.0 නිපුණතාව

භාෂා හා සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් සංස්කෘතිය සාරධර්ම හඳුනාගෙන ජාතිකාභිමානය දේශමාමකත්වය හා සහජීවනය ගොඩනගා ගැනීම සඳහා ක්‍රියා කරයි.

9.1 සංස්කෘතික උරුමය හා හර පද්ධතීන් පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.

9.2 දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ ඇසුරු කරයි.

9.3 විවිධ ජන කොට්ඨාසවලට අයත් සිරිත් විරිත් හඳුනාගෙන අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

## 10.0 නිපුණතාව

නව සාහිත්‍ය, දාර්ශනික, විද්‍යාත්මක සහ තාක්ෂණික වටිනාකමෙන් යුත් නිර්මාණ පරිශීලනයෙන් ලබාගත් දැනුම විවිධ භාෂා කාර්යයන් ඉටු කරගැනීම සඳහා යොදා ගනියි.

10.1 අද්‍යතන සාහිත්‍ය නිර්මාණවල කැපී පෙනෙන භාෂා රටා සම්ප්‍රදායයන් හා සුවිශේෂතා හඳුනාගෙන විස්තර කරයි.

## 11.0 නිපුණතාව

රසඥතාව වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

11.1 ගද්‍ය පද්‍ය නිර්මාණ කියවා රස විඳියි.

11.2 විවිධ සාහිත්‍ය නිර්මාණ පිළිබඳ රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

## 12.0 නිපුණතාව

අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

12.1 පද්‍ය රචනා නිර්මාණය කරයි.

12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි.